Lesson -21

# කරලා තිබුණු ක්‍රියා

තවත් උදාහරන

කලින් පාඩමේදී ඔබ ඉගෙන ගත්තේ අතීත කාලේ  යම් කිසි අවස්ථාවකදී යම් ක්‍රියාවක් කෙරී තිබුනා කියන අදහස දෙන කාලය. එම කාලයේ වාක්‍ය හැදෙන හැටි දැන් ඔබ හොදින්ම දන්නවා.  ඒ tense එක හදුන්වන්නෙ past perfect tense කියලා. ඒ tense එකේ තවත් උදාහරණ අපි මේ පාඩමේදී බලමු. මෙහිදිත් වෙනත් කාලයන්ට අයත් වාක්‍ය රටා මෙම කාලයත් සමග යෙදී තිබෙනවා (වරහන් තුල සදහන් වෙන්නෙ ඒවා) මන්ද මෙම කාලය බොහෝවිට භාවිතා වෙන්නෙ තවත් කාලයක අදහසක් සමග බද්ධව. ඒ සියල්ල ඔබේ දැනුම තව තවත් වර්ධනය කරාවි, සහ ඔබේ කථන හැකියාවන් වඩාත් ඉහල මට්ටමකට නංවාවි. මෙහිදීත් තේරුම් දීමේදී අපි බොහෝවිට දී තිබෙන්නේ සිංහල ව්‍යවහාරයේදී බොහෝ විට ඒ අදහස සිංහලෙන් කියවෙන්න ඉඩ තිබෙන විදිය

I had known about him for some time
අයි හෑඩ් නෝන් අබවුට් හිම් ෆෝ සම්ටයිම්
මම ඔහු ගැන දැනං හිටියා(දැනං හිඳ තිබුණා) කාලයක් තිස්සේ

Had you known about this incident?
හැඩ් යූ නෝන් අබවුට් දිස් ඉන්සිඩන්ට්?
ඔයා මේ සිද්ධිය ගැන දැනං හිටියද?(දැනං හිඳ තිබුණාද?)

I had heard about it
අයි හෑඩ් හ(ර්)ඩ් අබවුට් ඉට්
මම ඒ ගැන අහලා තිබුණා

He had gone (when we went there)
හී හෑඩ් ගෝන් (වෙන් වී වෙන්ට් දෙයා(ර්)
අපි එහෙ යනකොට ඔහු ගිහිල්ලා (ගිහිල්ලා තිබුණා)

Had you told him about this?
හැඩ් යූ ටෝල්ඩ් හිම් අබවුට් දිස්?
ඔයා ඔහුට මේ ගැන කියලා තිබුණද?

He had blamed me
හී හෑඩ් බ්ලේම්ඩ් මී
ඔහු මට බැනලා තිබුණා

They  had canceled the meeting
දේ හෑඩ් කැන්සල්ඩ් ද මීටින්
ඔවුන් රැස්වීම අවලංගු කර තිබුනා

Someone had opened my bag
සම්වන්  හෑඩ්  ඕපන්ඩ්  මයි බෑග්
කව්ද මගේ බෑග් එක ඇරලා තිබුනා

Someone  had taken my umbrella
සම්වන්  හෑඩ්  ටේකන් මයි අම්බ්‍රෙල්ලා
කව්ද මගේ  කුඩේ අරගෙන තිබුනා

She had seen you
ෂී  හැඩ් සීන්  යූ
ඇය  ඔයාව දැකලා  තිබුනා

He had asked about you
හී  හෑඩ්  ආස්ක්ඩ් අබවුට් යූ
ඔහු ඔයා ගැන අහලා තිබුනා

They had closed the gates
දේ හෑඩ් ක්ලෝස්ඩ්  ද ගේට්ස්
ඔවුන් ගේට්ටු වහලා තිබුනා

He had left early
හී හෑඩ්  ලෙෆ්ට්  අ(ර්)ලි
ඔහු වේලාසනින් පිටත් වෙලා තිබුනා

Someone had told him about it
සම්වන්  හෑඩ්  ටෝල්ඩ් හිම්  අබවුට් ඉට්
කව්ද ඔහුට ඒ ගැන කියලා තිබුන

I had done my homework
අයි හෑඩ් ඩන් මයි හෝම් ව(ර්)ක්
මම මගේ ගෙදර වැඩ කරලා තිබුනා

The children had gone to bed early
ද චිල්ඩ්‍රන් හෑඩ් ගෝන් ටු බෙඩ් අ(ර්)ලි
ළමයි වේලාසන නින්දට ගිහින් තිබුනා

We had met before
වී හෑඩ් මෙට් බිෆෝ
අපි කලින් හම්බ වෙලා තිබුනා

Someone had littered the floor
සම්වන් හෑඩ් ලිට(ර්)ඩ් ද ෆ්ලෝ
කව්ද බිම හැඩි කරලා තිබුනා

I had read that book before
අයි හෑඩ් රෙඩ් දැට් බුක් බිෆෝ
මම ඒ පොත කලින් කියවලා තිබුනා

We had seen that film before
වී හෑඩ් සීන් දැට් ෆිල්ම් බිෆෝ
අපි ඒ චිත්‍රපටිය කලින් බලලා තිබුනා

It had rained heavily
ඉට් හෑඩ් රේන්ඩ් හෙවිලි
හොඳටම වැහැල තිබුනා

They had changed their plan
දේ හෑඩ් චේන්ජ්ඩ් දෙයා ප්ලෑන්
ඔවුන් ඔවුන්ගේ සැලැස්ම වෙනස් කරලා තිබුනා

Mother had cooked some milk rice
මද(ර්) හැඩ් කුක්ඩ් සම් මිල්ක් රයිස්
අම්මා කිරි බත් වගයක් උයලා තිබුනා

He had come early
හී හැඩ් කම් අ(ර්)ලි
ඔහු වේලාසන ඇවිත් තිබුනා

I had lost my keys.
අයි හැඩ් ලොස්ට් මයි කීස්
මට මගේ යතුරු නැතිවෙලා තිබුනා

He had broken his leg.
හී හැඩ් බ්‍රෝකන් හිස් ලෙග්
ඔහුගේ කකුල කැඩිලා තිබුනා (වාක්‍යයේ වචන වල අර්ථය අනුව ඔහු ඔහුගේ කකුල කඩලා තිබුනා නෙවෙයි මින් අදහස් වෙන්නේ)

The teacher had started the lesson.
ද ටීච(ර්) හැඩ් ස්ටාටඩ් ද ලෙසන්
ගුරුතුමිය පාඩම පටන් අරන් තිබුනා

They had already eaten dinner.
දේ හැඩ් ඕල්රෙඩි ඊට්න් ඩින(ර්)
ඔවුන් ඒ වෙනකොටත් රෑ කෑම කාලා තිබුනා

He had threatened me
හී හැඩ් ත්රෙටින්ඩ් මී
ඔහු මට තර්ජනය කරලා තිබුනා

She had asked to cancel the wedding
ෂී හැඩ් ආස්ක්ඩ් ටු කැන්සල් ද වෙඩින්
ඇය විවාහ උත්සවය අවලංගු කරන්න කියලා තිබුන

You had left the door unlocked
යූ හැඩ් ලෙෆ්ට් ද ඩෝ අන්ලොක්ඩ්
ඔයා දොර ලොක් නොකර ගිහින් තිබුණා (left කියන්නෙ leave(ලීව්) - හැරදා යනවා/පිටත්ව යනවා/දාල යනවා යන ක්‍රියා පදයේ past participle රූපය)

You had left the fan on
යූ හෑඩ් ලෙෆ්ට් ද ෆෑන් ඔන්
ඔයා ෆෑන් එක දාලා ගිහින් තිබුණා

We had not slept all night
වී හෑඩ් නොට් ස්ලෙප්ට් ඕල් නයිට්
අපි රෑ පුරාම නිදාගෙන තිබුනේ නැහැ

I had not heard about him before
අයි හැව් නොට් හ(ර්)ඩ් අබවුට් හිම් බිෆෝ
මම ඔහු ගැන කලින් අහලා තිබුනේ නැහැ

The floods had not subsided
ද ෆ්ලඩ්ස් හෑඩ් නොට් සබ්සයිඩඩ්
ගංවතුර බැහැලා ගිහින් තිබුනේ නැහැ

They had not switched off the fans
දේ හෑඩ් නොට් ස්විච්ඩ් ඕෆ් ද ෆෑන්ස්
ඒගොල්ලෝ ෆෑන්ස් ඕෆ් කරලා තිබුනේ නැහැ

.

She had not given him my message
ෂී හෑඩ් නොට් ගිවන් හිම් මයි මැසේජ්
ඇය ඔහුට මගේ පණිවිඩය දීලා තිබුනී නැහැ

She had not told him about it
ෂී හැඩ් නොට් ටෝල්ඩ් හිම් අබවුට් හිම්
ඇය ඒ ගැන ඔහුට කියලා තිබුනේ නැහැ

They had not gone to school
දේ හෑඩ් නොට් ගෝන් ටු ස්කූල්
ඔවුන් පාසල් ගිහින් තිබුනේ නැහැ

We had not met before
වී හැඩ් නොට් මෙට් බිෆෝ
අපි කලින් හම්බ්වෙලා තිබුනේ නැහැ

I had not read that book
අයි හැඩ් නොට් රෙඩ් දැට් බුක්
මම ඒ පොත කියවලා තිබුනේ නැහැ

They hadn't arrived on time
දේ හැඩින්ට් අරයිව්ඩ් ඔන් ටයිම්
ඔවුන් වේලාවට ඇවිත් තිබුනේ නැහැ

We hadn't opened the door
වී හැඩින්ට් ඕපන්ඩ් ද ඩෝ(ර්)
අපි දොරටුව විවෘත කරලා තිබුනේ නැහැ

They hadn't brought their bags
දේ හැඩින්ට් බ්රෝට් දෙයා(ර්) බෑග්ස්
ඔවුන් තමන්ගේ බෑග්ස් අරගෙන ඇවිත් තිබුනේ නැහැ

The teacher hadn't marked our papers
ද ටීච(ර්) හැඩින්ට් මාක්ඩ් අව(ර්) පේප(ර්)ස්
ගුරුතුමා අපේ උත්තර පත්තර ලකුණු කරලා තිබුනේ නැහැ

He hadn't said anything
හී හැඩින්ට් සේඩ් එනිතිං
ඔහු කිසිම දෙයක් කිව්වා තිබුනේ නැහැ

Had they finished the work ?
හැඩ් දේ ෆිනිශ්ඩ් ද ව(ර්)ක් ?
ඔවුන් වැඩේ ඉවර කරලා තිබුනද ?

Had she given him the message ?
හැඩ් ෂී ගිවන් හිම් ද මැසෙජ් ?
ඇය ඔහුට පණිවිඩය දීලා තිබුනද ?

Had the train left ?
හැඩ් ද ට්‍රේන් ලෙෆ්ට් ?
කෝච්චිය ගිහින් තිබුනද ?

Had they prepared everything ?
හැඩ් දේ ප්‍රිපෙයාඩ් එව්රිතිං ?
ඔවුන් හැමදේම සුදානම් කරලා තිබුනද ?

Had he brought it back?
හැඩ් හී බ්‍රෝට් ඉට් බැක් ?
ඔහු ඒක ආපහු ගෙනත් තිබුනද ?

Had she seen me ?
හැඩ් ෂී සීන් මී ?
ඇය මාව දැකලා තිබුනද ?

Had you asked him to come ?
හැඩ් යූ ආස්ක්ඩ් හිම් ටු කම් ?
ඔයා ඔහුට එන්න කියලා තිබුනද ?

Had she thrown it away ?
හැඩ් ෂී ත්‍රෝන් ඉට් අවේ ?
ඇය ඒක වීසි කරලා තිබුනද ?

Had he taken it away ?
හැඩ් හී ටේකන් ඉට් අවේ ?
ඔහු ඒක අරන් ගිහින් තිබුනද ?

Had they closed the gate ?
හැඩ් දේ ක්ලෝස්ඩ් ද ගේට් ?
ඔවුන් ගේට්ටුව වහලා තිබුනද ?

Had they gone to school?
හැඩ් දේ ගෝන් ටු ස්කූල්?
ඔවුන් පාසලට ගිහින් තිබුනද ?

Had the children cleaned the classroom?
හැඩ් ද චිල්ඩ්‍රන් ක්ලීන්ඩ් ද ක්ලාස්රූම්?
ළමයි පන්ති කාමරය පිරිසිදු කරලා තිබුනද?

Had he found his keys?
හැඩ් හී ෆවුන්ඩ් හිස් කීස්?
ඔහු ඔහුගේ යතුරු සොයාගෙන තිබුනද?

Had they gone there in time?
හැඩ් දේ ගෝන් දෙයා  ඉන් ටයිම්?
ඔවුන්වෙලාවට එතනට ගිහින් තිබුනද ?

Had they completed the work?
හැඩ් දේ  කොම්පීලිටඩ් ද ව(ර්)ක්?
ඔවුන් වැඩය අවසන් කරලා තිබුනද?

Had the children done their homework?
හැඩ් ද චිල්ඩ්‍රන් ඩන් දෙයා හෝම්ව(ර්)ක්?
ළමයින් ගෙදර වැඩ කරලා තිබුනද ?

Had it rained?
හැඩ් ඉට් රේන්ඩ්?
වැහැල  තිබුනද ?

Had he received the message?
හැඩ් හී රිසීව්ඩ් ද මෙසේජ්?
ඔහුට  පණිවුඩය ලැබිලා තිබුනද ?

Had he fallen ill?
හැඩ් හී ෆෝලන් ඉල්?
ඔහු අසනීප වෙලා තිබුනද ?

Had the vehicle broken down on the way?
හැඩ් ද වෙහිකල් බ්‍රෝකන් ඩවුන් ඔන් ද වේ?
මගදී වාහනය කැඩිලා තිබුනද ?

Had she lost her purse?
හැඩ් ෂී ලොස්ට් හ(ර්) ප(ර්)ස්?
ඇය ඇගේ ප(ර්)ස් එක නැති කරන්  තිබුනද ?

Had he given the message to her?
හැඩ් හී ගිවන් ද මැසේජ් ටු හ(ර්)?
ඔහු ඇයට පණිවිඩය දීලා තිබුණද?

Hadn’t they informed you earlier?
හැඩින්ට් දේ ඉන්ෆෝම්ඩ් යූ අ(ර්)ලිය(ර්) ?
ඔවුන් ඔබට කලින් දැනුම්දීලා තිබුනේ නැද්ද ?

Hadn’t she prepared anything ?
හැඩින්ට් ෂී ප්‍රිපෙයාඩ් එනිතින් ?
ඇය කිසිදෙයක් ලැහැස්ති කරලා තිබුනේ නැද්ද ?

Hadn’t the meeting started when you arrived?
හැඩින්ට් ද මීටින් ස්ටාටඩ් වෙන් යූ අරයිව්ඩ් ?
ඔයා යනකොට රැස්වීම පටන් අරන් තිබුනේ නැද්ද ?

Hadn’t he left the key with you?
හැඩින්ට් හී ලෙෆ්ට් ද කීස් ෆෝ යූ ?
ඔහු ඔයාට යතුර තියලා ගිහින් තිබුනේ නැද්ද ?

Hadn’t the team prepared for the match ?
හැඩින්ට් ද ටීම් ප්‍රිපෙයාඩ් ෆෝ ද මැච් ?
ටීම් එක මැච් එකට සූදානම් වෙලා හිටියේ නැද්ද ?

What had he done?
වට් හෑඩ් හී ඩන්?
ඔහු මොකක්ද කරලා තිබුණේ?

Why had she gone ?
වයි හැඩ් ෂී ගෝන් ?
ඇයි ඇය ගිහින් තිබුනේ ?

Why hadn‘t she come ?
වයි හැඩින්ට් ෂී කම් ?
ඇයි ඇය ඇවිත් නොතිබුනේ ?

Why hadn't they invited him ?
වයි හැඩින්ට් දේ ඉන්වයිටඩ් හිම් ?
ඇයි  ඔවුන් ඔහුට ආරාධනා කරලා නොතිබුනේ ?

The train had left (when  we  went  there )
ද ට්‍රේන්  හෑඩ්  ලෙෆ්ට් වෙන් වී වෙන්ට් දෙයා
කෝච්චිය පිටත් වෙලා තිබුනා (අපි එතනට යනකොට )

The bus had just left (when we went to the bus stand)
ද බස් හෑඩ් ජස්ට් ලෙෆ්ට් වෙන් වී වෙන්ට් ටු ද බස් ස්ටෑන්ඩ්.
අපි බස් ස්ටෑන්ඩ් එකට යනකොට බස් එක ගියා විතරයි(සුළු මොහොතකට පෙර ගිහින් තිබුණා)-
මෙහිදී just භාවිතා කිරීමෙන් එම ක්‍රියාව සුලු මොහොතකට පෙර සිදුවූ බව හැගවෙනවා

(When the police came) the suspect had already run away
(වෙන් ද පලීස් කේම් ) ද සස්පෙක්ට් හෑඩ් ඕල්රෙඩි රන් අවේ
(පොලීසිය එනකොට) සැකකරු ඒවන විටත් පැනලා ගිහින් තිබුණා (police කියන වචනය නිවැරදිව ශබ්ධ කරන්නේ පොලිස් කියල නෙවෙයි පලීස් කියල )

I had fallen asleep ( when you called me)
අයි හෑඩ්  ෆෝලන් ඇස්ලීප් (වෙන් යූ කෝල්ඩ් මී)
(ඔයා කෝල් කරන කොට) මට නින්ද ගිහින් තිබුණෙ

I had seen him before ( So I could recognize him at once)
අයි හෑඩ් සීන් හිම් බිෆෝ. (සෝ අයි කුඩ් රෙකග්නයිස් හිම් ඇට් වන්ස්)
මම ඔහුව කලින් දැකලා තිබුණා. (ඒ නිසා මට ඔහුව එකපාරටම හඳුනගන්න පුළුවන් වුනා)

She had prepared everything (by the time we arrived there)
ෂී හෑඩ් ප්‍රිපෙයාඩ් එව්රිතිං (බයි ද ටයිම් වී අරයිව්ඩ් දෙයා)
ඇය හැමදේම ලැහැස්ති කරලා තිබුණා (අපි එහෙට ළඟා වෙනකොට)

They had gone somewhere ( so we didn't meet them)
දේ හෑඩ් ගෝන් සම්වෙයා. (සෝ වී ඩිඩ්න්ට් මීට් දෙම්)
ඔවුන් කොහෙද ගිහින් තිබුණා. (ඒනිසා අපිට ඔවුන් හමු වුණේ නෑ)

(I didn't have any money) because I had lost my purse
(අයි ඩිඩ්න්ට් හෑව් එනි මනී) බිකෝස් අයි හෑඩ් ලොස්ට් මයි ප(ර්)ස්
මගේ ප(ර්)ස් එක නැතිවෙලා තිබුණු නිසා (මගෙ ළඟ සල්ලි කීයක්වත් තිබුණේ නෑ)

I had never seen a Zebra ( until you took me to the zoo)
අයි හෑඩ් නෙව(ර්) සීන් අ සීබ්‍රා (අන්ටිල් යූ ටුක් මී ටු ද සූ)
මම කවදාවත් සීබ්‍රාවෙක් දැකලා තිබුණේ නෑ (ඔයා මාව සත්තු වත්තට එක්ක යනකල්)
(මෙහි never එන නිසා had not ලෙස යොදන්න අවශ්‍ය නෑ. Never වල නැතාර්ථය ගැබ් වන නිසා)

I had never heard about it (until you told me)
අයි හෑඩ් නෙව(ර්) හ(ර්)ඩ් අබවුට් (ඉට් අන්ටිල් යූ ටෝල්ඩ් මී)
මම කවදාවත් ඒ ගැන අහලා තිබුණේ නෑ (ඔයා මට කියනකල්)

I hadn't slept for 3 days (so I couldn't keep my eyes open)
අයි හැඩින්ට් ස්ලෙප්ට් ෆෝ ත්‍රී ඩේස් (සෝ අයි කුඩින්ට් කීප් මයි අයිස් ඕපන්)
මට දවස් 3ක් නිදාගෙන තිබුනෙ නෑ, (ඒ නිසා මට ඇස් ඇරගෙන ඉන්න බැරි වුනා)

They had run away (before I saw them)
දේ හැඩ් රන් අවේ බිෆෝ (අයි සෝ දෙම්)
මම දකින්න කලින් ඔවුන් පැනලා දුවලා තිබුණා

Someone had put this note here
සම්වන් හෑඩ් පුට් දිස් නෝට් හියර්)
කවුද මේ සටහන මෙතන තියලා තිබුණා

I had just come back home (when she phoned me)
අයි හෑඩ් ජස්ට් කම් බැක් හෝම් (වෙන් ෂී ෆෝන්ඩ් මී)
ඇය මට ෆෝන් කරන කොට මම ගෙදර ආවා විතරයි(සුළු මොහොතකට කලින් ඇවිත් තිබුණා.)-
(මෙතනදී just වල භාවිතය සැලකිල්ලට ගන්න)

(I could answer all the questions easily) because I had memorized the lessons very well.
(අයි කුඩ් ආන්ස(ර්) ඕල් ද ක්වෙස්චන්ස් ඊසිලි) බිකෝස් අයි හෑඩ් මෙමරයිස් ද ලෙසන්ස් වෙරි වෙල්.
(මට සේරම ප්‍රශ්න වලට උත්තර ලියන්න පුළුවන් වුනා ලේසියෙන්ම ( මම හොඳට පාඩම් කට පාඩම් කරලා තිබුණ නිසා)

I had wanted a laptop (but he sent me a tab)
අයි හෑඩ් වෝන්ටඩ් අ ලැප්ටොප් (බට් හී සෙන්ට් මී අ ටැබ්)
මට ඕන කරලා තිබුණේ ලැප්ටොප් එකක් ( නමුත් ඔහු මට එව්වේ ටැබ් එකක් )

They had finished all the food we had prepared (so we had to buy some from outside
දේ හෑඩ් ෆිනිෂ්ඩ් ඕල් ද ෆුඩ් වී හෑඩ් ප්‍රිපෙයාඩ් (සෝ වී හෑඩ් ටු බයි සම් ෆොම් අවුට් සයිඩ්)
අපි සූදානම් කරලා තිබුනු ඔක්කොම කෑම ඒගොල්ලො ඉවර කරලා තිබුනා ( ඒ නිසා අපිට පිටින් කෑම ටිකක් ගන්න වුනා )

She had asked me to come at 3 o'clock today but she had gone somewhere( when I went there to meet her)
ෂී හෑඩ් ආස්ක් මී ටු කම් ඇට් 3 ඔ'ක්ලොක් ටුඩේ බට් ෂී හෑඩ් ගෝන් සම්වෙයා (වෙනයි වෙන්ට් දෙයා ටු මීට් හ(ර්) )

ඇය මට අද 3ට එන්න කියලා තිබුනා නමුත් ( මම එහෙ යන කොට ) ඇය කොහෙද ගිහින් තිබුනා

She had not seen him before
ෂී හැඩ් නොට් සීන් හිම් බිෆෝ
ඇය ඔහුව කලින් දැකලා තිබුනේ නැහැ

I had not taken my lunch ,(so I was feeling very hungry)
අයි හෑඩ් නොට් ටේකන් මයි ලන්ච් , (සෝ අයි වෝස් ෆීලිං වෙරි හංග්‍රි)
මම මගේ දිවා ආහාරය අරගෙන තිබුනේ නැහැ ,( ඒ නිසා මට ගොඩාක් බඩගිනි දැනෙමින් තිබුනා )

Lesson 21

# Spoken English

අපි මේ පාඩමේදී ඉගෙන ගමු අයහපත් කාලගුණය ගැන කතා කරන හැටි. විශේෂයෙන් වැස්ස ගැන. මෙය දෙබස් ආකාරයට නෙමෙයි, වාක්‍ය වශයෙන් දී තිබෙන්නේ. මන්ද එකම දේ කිහිප ආකාරයකට ප්‍රකාශ කරන විදිය ඔබට දිය යුතු නිසා. මෙහි එන ඇතැම් වාක්‍ය රටාවන් කාලගුණය ගැන කතාකරන්න පමණක් නොවෙයි වෙන ඕනෑම අවස්ථාවකට ගලපාගෙන පාවිච්චි කල හැකියි. එසේ ගලපාගෙන පාවිච්චි කිරීමේ හැකියාව ඔබ විසින් ගොඩ නගාගත යුතුයි. ඔබට මේ භාෂාව සාර්ථක කර ගැනීමට නම් අනිවාර්යයෙන්ම ඔබ ඒ හැකියාව ගොඩ නගා ගත යුතුයි. එක වාක්‍යයක් ඔබට ලැබුනාම එහි අදාල වෙනස්කම් කරගනිමින් අනෙකුත් අවස්ථා වලටත් එය ගලපාගෙන පාවිච්චි කිරීමේ හැකියාව ඔබ සතුවිය යුතුයි. හොදයි බලමු වැස්ස ගැන මොනවද අපිට කතා කරන්න තියෙන්නේ කියලා

Did it rain yesterday ?
ඩිඩ් ඉට් රේන් යෙස්ටඩේ ?
ඊයේ වැස්සද ?

Yes . it rained yesterday
යස් , ඉට් රේන්ඩ් යෙස්ටඩේ
ඔව් , ඊයේ වැස්සා

It rained hard yesterday
ඉට් රේන්ඩ් හාඩ් යෙස්ටඩේ
ඊයේ තදින් වැස්සා

It didn't rain yesterday
ඉට් ඩිඩ්න්ට් රේන් යෙස්ටඩේ
ඊයේ වැස්සේ නැහැ

It rained a little yesterday
ඉට් රේන්ඩ් අ ලිට්ල් යෙස්ටඩේ
ඊයේ ටිකක් වැස්සා

I got caught up in the rain
අයි ගොට් කෝට් අප්(කෝටප්) ඉන් ද රේන්
මාව වැස්සට අහුවුනා

It rained hard yesterday and I got badly wet
ඉට් රේන්ඩ් හාඩ් යෙස්ටඩේ ඇන්ඩ් අයි ගොට් බෑඩ්ලි වෙට්
ඊයේ තදින් වැස්සා , මාව හොදටම තෙමුනා (get wet කියන්නේ තෙමෙනවා , එහි අතීත කාලය got wet )

Will it rain today ?
විල් ඉට් (විලිට්) රේන් ටුඩේ ?
අද වහිවිද ?

It might rain today
ඉට් මයිට් රේන් ටුඩේ
අද වහින්න පුළුවන්

It will rain today
ඉට් විල් රේන් ටුඩේ
අද වහිවී

It’s going to rain
ඉට්ස් ගොයිං ටු රේන්
වහින්න යන්නේ

It looks like it’s going to rain
ඉට් ලුක්ස් ලයික් ඉට්ස් ගොයිං ටු රේන්
වහින්න යනවා වගේ පේන්නේ(වහින්න හදන හැඩයි) ( look like  කියන්නෙ වගේ පේනවා)

The sky is cloudy and gloomy
ද ස්කයි ඉස් ක්ලවුඩි ඇන්ඩ් ග්ලූමි
අහස වළාකුලින් බර සහ අඳුරුයි

Sky is getting dark
ස්කයි ඉස් ගෙටිං ඩාක්
අහස අඳුරු වී ගෙන යනවා

It will rain
ඉට් විල් රේන්
වහීවි

It might rain in the evening
ඉට් මයිට් රේන් ඉන් දි ඊව්නිං
හැන්දෑවේ වහින්න පුළුවන් ( might - කියන්නෙ විය හැකියි කියන අදහස දෙන උප  ක්‍රියා පදයක් - 32 පාඩම )

It rains in the evening these days
ඉට් රේන්ස් ඉන් දි ඊව්නිං දීස් ඩේස්
මේ දවස්වල හැන්දෑවේ වහිනවා

Take an umbrella if you want to go out
ටේක්  ඇන් අම්බ්‍රෙල්ලා ඉෆ් යූ වෝන්ට් ටු ගෝ අවුට්
ඔයාට එළියට යන්න ඕන නම් කුඩයක් අරන් යන්න

You better take an umbrella
යූ  බෙට(ර්) ටේක්  ඇන් අම්බ්‍රෙල්ලා
ඔයා කුඩයක් අරන් යන එක හොදයි

Wait a little , It’s going to rain
වේට්  අ ලිට්ල් , ඉට්ස් ගොයිං  ටු රේන්
පොඩ්ඩක්  ඉන්න, වහින්න යන්නේ

Don’t go now . A storm is brewing
ඩෝන්ට් ගෝ නව්, අ ස්ටෝම් ඉස් බෲවිං
දැන් යන්න එපා, මහා කුණාටුවක් එන්නේ

Oh ,It’s starting to rain
ඔහ් , ඉට්ස් ස්ටාටිං ටු රේන්
ඔහ් , ඔන්න වහින්න පටන් ගන්නවා

Oh , It’s raining harder
ඔහ් ඉට්ස් රේනිං හාඩ(ර් )
ඔහ් , ඔන්න තව හයියෙන් වහිනවා

You have to wait until the rain stops
යූ හෑව් ටු වේට් අන්ටිල් ද රේන් ස්ටොප්ස්
වැස්ස පායනකල් ඔයාට ඉන්න වෙයි

Is it raining outside?
ඉස් ඉට් (ඉසිට්) රේනිං අවුට්සයිඩ්?
එළියේ වහිනවද?

It starting to rain
යස්, ඉට්ස් ස්ටාටිං ටු රේන්
ඔව්, වහින්න පටන් ගන්නවා.

It’s not raining. It’s only drizzling.
ඉට්ස් නොට් රේනිං. ඉට්ස් ඔන්ලි ඩ්‍රිස්ලිං.
වහින්නෙ නෑ. පොද ගහනවා විතරයි.

It’s raining hard.
ඉට්ස් රේනිං හාඩ්.
හයියෙන් වහිනවා.

It’s raining incessantly
ඉට්ස් රේනිං ඉන්සෙසන්ට්ලි
ඉවරයක් නැතුව වහිනවා (incessantly- ඉවරයක් නැතුව/ අතොරක් නැතුව)

Don’t go now. You will get wet
ඩෝන්ට් ගෝ නව්.යු විල් ගෙට් වෙට්
දැන් යන්න එපා. ඔයාව තෙමෙයි

You will get caught up in the rain
යූ විල් ගෙට් කෝට් අප් ඉන් ද රේන්
ඔයාව වැස්සට අහුවේවි

I got caught in the rain yesterday
අයි ගොට් කෝට් ඉන් ද රේන් යෙස්ටඩේ
මාව ඊයේ වැස්සට අහුවුණා

It rained hard / heavily
ඉට් රේන්ඩ් හාඩ්/හෙවිලි
තදින් වැස්සා

I got soaked in the rain
අයි ගොට් සෝක්ඩ් ඉන් ද රේන්
මාව හොදටම වැස්සට තෙමුණා (get soaked - කියන්නෙ පෙගෙනවා කියන එක )

I am dripping wet
අයෑම් ඩ්‍රිපිං වෙට්.
මගේ ඇඟේ තෙත බේරෙනවා

Take this towel and dry yourself off
ටේක් දිස් ටවල් ඇන්ඩ් ඩ්‍රයි යුව(ර්)සෙල්ෆ් ඕෆ්
මේ තුවාය අරන් පිහදා ගන්න

It could rain again
ඉට් කුඩ් රේන් අගේන්
ආපහු වහින්න පුළුවන්(මෙහි could වලින් හැගවෙන්නෙ විය හැකි බව. could ඒ අර්ථයෙන්
ඉංගීසි භාෂාවේ බහුල ලෙස යෙදෙනවා - 32 පාඩම )

Rain will stop soon
රේන් විල් ස්ටොප් සූන්
වැස්ස නවතීවි ඉක්මනින්

It will stop raining soon
ඉට් විල් ස්ටොප් රේනිං සූන්
වැස්ස නවතීවි ඉක්මනින්

Please wait until it stops raining
ප්ලීස් වේට් අන්ටිල් ඉට් ස්ටොප්ස් රේනිං
වැස්ස නවතිනකල් ඉන්න

It won’t stop soon
ඉට් වෝන්ට් ස්ටොප් සූන්
ඒක ඉක්මනින් නවතින එකක් නෑ

It doesn’t look like it will stop soon
ඉට් ඩස්න්ට් ලුක් ලයික් ඉට් විල් ස්ටොප් සූන්
ඒක ඉක්මනින් නවතින පාටක් නෑ

It has stopped raining!
ඉට් හෑස් ස්ටොප්ඩ් රේනිං !
වැස්ස නැවතිලා

Has it stopped raining?
හෑස් ඉට් ස්ටොප්ඩ් රේනිං?
වැස්ස නැවතිලාද?

Take your umbrella. You will get caught in the rain
ටේක් යුව(ර්) අම්බ්‍රෙල්ලා. යූ විල් ගෙට් කෝට් ඉන් ද රේන්
ඔයාගේ කුඩේ අරන් යන්න. ඔයාව වැස්සට අහුවේවි

It’s lighting and thundering heavily
ඉට්ස් ලයිට්නිං ඇන්ඩ් තන්ඩරිං හෙවිලි.
හයියෙන් විදුලිකොටනවා, ගොරවනවා

It’s raining harder
ඉට්ස් රේනිං හාඩ(ර්)
තව හයියෙන් වහිනවා

It has been raining all day
ඉට් හෑස් බීන් රේනිං ඕල් ඩේ
මුළු දවසෙම වැස්ස

It has been raining all afternoon
ඉට්  හෑස් බීන් රේනිං ඕල් ආෆ්ට(ර්)නූන්
හවස් වරුවෙම වහිනවා

This rain is awful.
දිස් රේන් ඉස් ඕෆුල්.
මේ වැස්ස හරිම  සවුත්තුයි (awful - ජරා , සවුත්තු )

I can’t even step out in this rain
අයි කාන්ට් ඊවන් ස්ටෙප් අවුට් ඉන් දිස් රේන්
මට එලියට බහින්නවත් බෑ මේ වැස්සෙ

Can’t do anything with this awful rain
කාන්ට් ඩූ එනිතිං විත් දිස් ඕෆුල් රේන්
මේ ජරා වැස්සත් එක්ක මුකුත් කරන්න බෑ

When will It stop ?
වෙන් විලිට් ස්ටොප් ?
ඒක කවදා/ කොයි වෙලාවෙ නතර වෙයිද ?

Can’t say when it will stop
කාන්ට් සේ වෙන් ඉට් විල් ස්ටොප්
කොයි වෙලාවෙ නතර වෙයිද කියලා කියන්න බැ

( කලින් වාක්‍යය(when will it stop ?) කෙලින්ම ප්‍රශ්නයක් . මේ වාක්‍යයේ ඊට පෙර තවත් වාක්‍යයක් තිබෙනවා can’t say කියලා. එවිට දෙවනුව යෙදෙන වාක්‍යය ප්‍රශ්න ස්වරූපයෙන් නෙවෙයි සාමාන්‍ය ස්වරූපයෙන් යෙදෙන්නේ )

It’s not going to stop soon
ඉට්ස් නොට් ගොයින් ටු ස්ටොප් සූන්
ඒක ඉක්මනින් නම් නතරවෙන්නෙ නෑ

It has been like this since morning
ඉට් හෑස් බීන් ලයික් දිස් සින්ස් මෝනින්
උදේ ඉදන් මේ වගේ තමයි

Do you think it will stop soon ?
ඩූ යූ තිංක් ඉට් විල් ස්ටොප් සූන් ?
ඔයා හිතනවද ඒක ඉක්මනින් නතර වෙයි කියලා ?

It will go on like this another few days
ඉට විල් ගෝ ඔන් ලයික් දිස් අනද(ර්) ෆිව් ඩේස්
තව දින කිහිපයක් මේ විදියට යාවි

I hate rainy days
අයි හේට් රේනි ඩේස්
වැස්ස දවස් මට පෙන්නන්න බැහැ (hate - තදින් අකමැතියි )

Rain has stopped
රේන් හෑස් ස්ටොප්ඩ්
වැස්ස පායලා

Rain has ceased
රේන් හෑස් සීස්ඩ්
වැස්ස පායලා (cease - සීස් - නතර වෙනවා)

Rain has slowed down . Now it's only a drizzle
රේන් හෑස් ස්ලෝව්ඩ් ඩවුන් . නව් ඉට්ස් ඔන්ලි අ ඩ්‍රිස්ල්
වැස්ස අඩුවෙලා , දැන් ඒක පොදයක් විතරයි (slow down - අඩු වෙනවා)

Rain has slowed down to a slight drizzle
රේන් හෑස් ස්ලෝව්ඩ් ඩවුන් ටු අ ස්ලයිට් ඩ්‍රිස්ල්
වැස්ස පොඩි පොදයක් ගානට අඩුවෙලා

Now the rain has ceased
නව් ද රේන් හෑස් සීස්ඩ්
දැන් වැස්ස පායලා

The sky cleared up a bit
ද ස්කයි ක්ලියර්ඩ් අප් අ බිට්
අහස පොඩ්ඩක් එලිය වුනා

Wait until the rain ceases
වේට් අන්ටිල් ද රේන් සීසස්
වැස්ස නතර වෙනකල් ඉන්න ( cease වලට s එකතු වෙන්නේ es ලෙස. එවිට සීසස් ලෙස ශබ්ධ වෙන්නේ )

Is it still raining ?
ඉස් ඉට්(ඉසිට් ) ස්ටිල් රේනිං ?
තාම වහිනවද ?

Yes , It's still raining
යර්ස් , ඉට්'ස් ස්ටිල් රේනිං
ඔව් , තාම වහිනවා

I don't have an umbrella to go out . Do you have an umbrella ?
අයි ඩෝන්ට් හෑව් ඇන් අම්බ්‍රෙල්ලා ටු ගෝ අවුට් . ඩූ යූ හෑව් ඇන් අම්බ්‍රෙල්ලා ?
මට එලියට යන්න කුඩයක් නැහැ . ඔයා ලග කුඩයක් තියෙනවද ?

Can I borrow an umbrella ?
කැන් අයි(කැනයි) බොරෝව් ඇන් අම්බ්‍රෙල්ලා ?
මට කුඩයක් ඉල්ලා ගන්න පුලුවන්ද ?

Can you give me an umbrella ?
කැන් යූ ගිව් මී ඇන් අම්බ්‍රෙල්ල ?
ඔයාට පුලුවන්ද මට කුඩයක් දෙන්න

Can I have an umbrella ?
කැන් අයි හෑව් ඇන් අම්බ්‍රෙල්ලා
මට කුඩයක් ගණන් පුලුවන්ද ?

Take this one
ටේක් දිස් වන්
මේක ගන්න

You cannot walk under this in this heavy rain . This is too small
යූ කැනොට් වෝක් අන්ඩ(ර්) දිස් ඉන් දිස් හෙවි රේන් . දිස් ඉස් ටූ ස්මෝල්
මේ මහා වැස්සේ මේකෙන් යන්න බැහැ , මේක පොඩි වැඩියි

Two people cannot walk under this umbrella . Don't you have a larger one ?
ටූ පීපල් කැනොට් වෝක් අන්ඩ(ර්) දිස් අම්බ්‍රෙල්ලා . ඩෝන්ට් යූ හෑව් අ ලාජ(ර්) වන් ?
දෙන්නෙකුට යන්න බැහැ මේ කුඩෙන් . ඔයා ලග මිට වඩා ලොකු එකක් නැද්ද ?

Take this one , but don't forget it somewhere
ටේක් දිස් වන්, ඩෝන්ට් ෆොගෙට් ඉට් සම්වෙයා
මේක ගන්න, නමුත් ඒක කොහේ හරි අමතක කරලා එන්න එපා

**Vocabulary 21**

Incident – ඉන්සිඩන්ට් – සිද්ධිය

Cancel – කැන්සල් – අවලංගු කරනවා

Someone – සම්වන් – කෙනෙක්

Threaten – ත්‍රෙට්න් – තර්ජනය කරනවා

Locked – ලොක්ට් – අගුලු දමා ඇති

Unlocked – අන්ලොක්ට් – අගුලු දමා නොමැති

Fan – ෆෑන් – පංකාව

Recognize – රෙකග්නයිස් – හඳුනාගන්නවා

Zoological garden – සුලොජිකල් ගාඩින් – සත්වෝද්‍යානය ( කෙටි - Zoo – සූ )

Memorize – මෙමරයිස් – මතක තබාගන්නවා, කටපාඩම් කරනවා

Flood – ෆ්ලඩ් – ගංවතුර

Subside – සබ්සයිඩ් – අඩු වෙනවා, බැස යනවා

Inform – ඉන්ෆෝම් – දැනුම් දෙනවා

Get wet – ගෙට් වෙට් – තෙත් වෙනවා, තෙමෙනවා

Cloudy – ක්ලවුඩි – වළාකුළු පිරි

Gloomy – ග්ලූමි – අඳුරු / මලානික

Brew – බෲ – පැසවනවා (මත්පැන් )

Brew - බෲ- (කුණාටුවක් ) ඇති වී ගෙන එනවා

Incessant – ඉන්සෙසන්ට් – නොනවතින

Incessantly – ඉන්සෙසන්ට්ලි – නොනවතින ලෙස ,නොනවත්වාම

Soak – සෝක් – උරාගන්නවා

Drip – ඩ්‍රිප් – බිංදු බිංදු වැටෙනවා

Dripping wet – ඩ්‍රිපින් වෙට් – තෙත බේරෙන

Towel – ටවල් – තුවාය

Awful – ඕෆුල් – ඉතා නරක, අප්‍රසන්න , ජරා

Step out – ස්ටෙප් අවුට් – එලියට බහිනවා

Cease – සීස් – නවතිනවා , අවසන් වෙනවා

Carving – කාවිං – කැටයම

Cash – කෑෂ් – මුදල්

Cassava – කැසාවා – මඤ්ඤොක්කා

Vote – වෝට් – ඡන්දය / ඡන්දය දෙනවා

Casual – කැෂුවල් – සාමාන්‍ය, අවිධිමත් , ගන්නට නොගෙන ,

Casual dress – කැෂුවල් ඩ්‍රෙස් – සාමාන්‍ය ඇඳුම

Category – කැටගරි – වර්ගය, කාණ්ඩය

Cave – කේව් – ගුහාව

Cavity – කැවිටි – කුහරය, දත් වල කුහරය

Decisive – ඩිසයිසිව් – තීරණාත්මක

Decline – ඩික්ලයින් – පිරිහෙනවා / පිරිහීම

Decline - ඩික්ලයින් -  ප්‍රතික්ෂේප කරනවා

Defeat – ඩිෆීට් – පරාජය, පරාජය කරනවා

Defecate – ඩෙෆිකේට් – මලපහ කරනවා

Definite – ඩෙෆිනිට් – නිශ්චිත

Definitely – ඩෙෆිනිට්ලි – අනිවාර්යයෙන්ම, නිසැකවම